## <u>වයඹ පළාත් ආයුර්වේද කොමසාරිස් (පරිපාලන I) තනතුරට පත්කිරීමට අදාළ ලකුණු ලබාදීමේ පටිපාටිය - 2023 (සංශෝධිත)</u>

<table>
<tr><th>නිර්ණායක</th><th>ලකුණු ලබා දෙන ආකාරය</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td>01.ජ්‍යෙෂ්ඨතාවය</td><td>(අ). පරිපාලන I ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට ලකුණු 10 බැගින්-<br><br>(ආ). පරිපාලන II ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට ලකුණු 06 බැගින්-<br><br>(ඇ). ආයුර්වේද වෛද්‍ය සේවයේ වෛද්‍ය නිලධාරි I ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට ලකුණු 04 බැගින්-<br><br>(ඈ). ආයුර්වේද වෛද්‍ය සේවයේ වෛද්‍ය නිලධාරි II ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට ලකුණු 02 බැගින් -<br><br>(සේවා කාලය ගණනය කිරීමේදී වසරකට අඩු සේවා කාලයක් සපුරා ඇති විටෙක මාස 06ක් හෝ ඊට වඩා වැඩි කාලයකට වසරකට හිමි ලකුණු ප්‍රමාණයෙන් අර්ධයක් හිමි වේ.)<br><br>සටහන:-<br>ඉහත (අ) යන්නට අදාල සුදුසුකම් සහිත නිලධාරීන් අයදුම්කර නොමැතිනම් පමණක් (ආ) සුදුසුකම් සහිත නිලධාරීන් ද එම නිලධාරීන් නොමැති නම් (ඇ) සුදුසුකම් සහිත නිලධාරීන් ද එම නිලධාරීන් නොමැති නම් (ඈ) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පිළිබඳව ද පිළිවෙලින් සළකා බලනු ලැබේ.</td><td>50</td></tr>
<tr><td>02.ආයුර්වේද ක්ෂේත්‍රයට අදාළ වෙනත් අධ්‍යාපන සුදුසුකම්<br><br>(ආයුර්වේද වෛද්‍ය සේවයේ වෛද්‍ය නිලධාරි I වන ශ්‍රේණියට උසස් වීමේදී හෝ මෙම තනතුරට අයදුම් කිරීමේදී මූලික සුදුසුකමක් ලෙස ඉදිරිපත් කරන සහතිකය හැර)</td><td>ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ II පරිශිෂ්ඨයේ ඇතුලත් විෂයයන් සම්බන්ධව-<br><br>(අ). PG (පශ්චාත් උපාධි ඩිප්ලෝමා) - (ලකුණු 07)<br><br>(ආ) MSC (විද්‍යාපති) - (ලකුණු 10)<br><br>(ඇ). Mphill (දර්ශනවේදී) - (ලකුණු 12)<br><br>(ඈ). PHD (දර්ශනපති) - (ලකුණු 15)<br><br>• ඉහලම සුදුසුකම ඇති එක් සහතිකයකට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.<br><br>• මූලික සුදුසුකමේදී සළකා බලන ලද රෝහල් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියට ඉහළ සුදුසුකමක් සපුරා ඇත්නම් පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.</td><td>15</td></tr>
<tr><td>03. කාර්යය සාධන ඇගයුම</td><td>සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට පෙර පූර්වාසන්න වසර 05ක කාල පරිච්ජේදයක් තුල වාර්ෂික කාර්ය සාධන ඇගයුමේ දී ලබා ගත් ඇගයුම් අනුව පහත දක්වා ඇති පරිදි ලකුණු ලබා දෙනු ඇත.<br><br>
<table>
<tr><th>කාර්ය සාධන ඇගයුමේදී ලබා ගත් ඇගයුම්</th><th>වසරක් සඳහා ලබා දෙන උපරිම ලකුණු</th></tr>
<tr><td>විශිෂ්ඨයි</td><td>ලකුණු 03</td></tr>
<tr><td>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ</td><td>ලකුණු 2.5</td></tr>
<tr><td>සතුටුදායකයි</td><td>ලකුණු 1.5</td></tr>
</table>
</td><td>15</td></tr>
</table>

| | | |
|---|---|---|
| 04. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අදාලව පළකර ඇති ප්‍රකාශන | ජාත්‍යන්තර මට්ටමේ සඟරාවල ශාස්ත්‍රීය පර්යේෂණ / ප්‍රකාශන හෝ ශ්‍රී ලංකා ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලයේ අනුමැතිය සහිත ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ සඳහා සඳහා - (ලකුණු 2.5 බැගින්)<br><br>• පශ්චාත් උපාධිය හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා ලකුණු ලබා දුන් ශාස්ත්‍රීය ග්‍රන්ථ / නිබන්ධන සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ. | 05 |
| 05. ලබාගත් පුහුණු (දේශීය / විදේශීය) | (අ). ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය හෝ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාලව හෝ සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ හෝ දින 05 කට වැඩි දින 14 කට අඩු පුහුණුවක් සඳහා (ලකුණු 01 බැගින්)<br><br>(ආ). ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය හෝ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාලව හෝ සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ හෝ සති 02ක් හෝ ඊට වැඩි පුහුණුවක් සඳහා - (ලකුණු 02 බැගින්) | 05 |
| 06. වෙනත් සුදුසුකම් | භාෂා හැකියාව (මාධ්‍යය භාෂාව හැර වෙනත් භාෂාවක් සම්බන්ධයෙන් රජය පිළිගත් ආයතනයක් විසින් නිකුත් කල පැය 100ක් ආවරණය වන ඩිප්ලෝමා) -<br><br>(අ). අනෙක් රාජ්‍ය භාෂාව (සිංහල / දෙමළ) - (ලකුණු 2.5)<br><br>(ආ). සන්ධාන භාෂාව (ඉංග්‍රීසි) - (ලකුණු 2.5)<br><br>(රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා යොදාගත් සහතිකය හැර වෙනත් සහතික ඉදිරිපත් කළ යුතුය.) | 05 |
| 07. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | සම්මුඛ පරීක්ෂණය සඳහා පූර්ව සූදානම/ කරුණු ඉදිරිපත් කිරීම/ නගනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීම/ සාමාන්‍ය හැසිරීම/ සාමාන්‍ය අවබෝධය යන කරුණු සලකා බලනු ලැබේ. (ලකුණු 05) | 05 |
| මුළු ලකුණු | | 100 |